PR/2018/ 25S

# ජපන් තානාපති කාර්යාලය

නො. 20 ශ්‍රීමත් ආර්.ජී. සේනානායක මාවත, කොළඹ 07

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629
ඊ-මේල්: cultujpn@sltnet.lk

අගෝස්තු 30, 2018

## පුවත්පත් නිවේදනය

**<u>ජපන් විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය නකානෙ මහතාගේ ශ්‍රී ලංකා විදේශ සංචාරය</u>**

ජපන් විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය කසුයුකි නකානෙ මහතා 2018 අගෝස්තු මස 28 වන දින සිට 30 වන දින දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලැබීය. එම සංචාරය අතරතුරදී නාවික මුර යාත්‍රාවන් (Patrol vessels) ශ්‍රී ලංකාවට ප්‍රදානය කිරීමේ උත්සවය සඳහා සහභාගි වූ අතර දෙරටෙහි ද්වීපාර්ශික සබඳතා වර්ධනය කරනු වස් ශ්‍රී ලංකා ආණ්ඩුවේ නායකයින් හමුවීමද සිදු විය.

කොළඹ වරායේදී අගෝස්තු මස 29 වන දින පිරිනමනු ලැබූ නාවික මුර යාත්‍රාවන් ද්විත්වයෙහි වටිනාකම යෙන් බිලියන 1.8 ක් ( රුපියල් බිලියන 2.3) වන අතර එය ජපන් රජයේ ආධාර යටතේ හිමිවූවකි. රාජ්‍ය අමාත්‍ය නකානෙ මහතා අවධාරණය කරනු ලැබුවේ නිදහස්, විවෘත, ස්ථාවර සහ සෞභාග්‍යමත් ඉන්දු-පැසිපික් සාගරයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රි ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාවට ජපානය සහයෝගය දක්වන බවයි. එමෙන්ම ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙම යාත්‍රාවන් උපයෝගී කර ගනිමින් සමුද්‍ර නීතියෙහි බලාත්මකබාවයෙහි ධාරිතාව වර්ධනය කරනු ඇතැයි ජපානය බලාපොරොත්තු වෙයි. මෙම මුර යාත්‍රාවන් **SLCGS සමුද්‍රාරක්ෂා** සහ **SLCGS සමාරක්ෂා** වශයෙන් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් නම් කෙරිණ.

එමෙන්ම රාජ්‍ය අමාත්‍ය නකානෙ මහතා සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා අතර හමුවක් පැවති අතර වැඩ බලන විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල, වැවිලි කර්මාන්ත අමාත්‍ය නවීන් දිසානායක මහතා සහ ජනාධිපති ලේකම් උදය සෙනෙවිරත්න යන මහත්වරුන් ද හමුවිය. මෙම හමුවීම තුලදී රාජ්‍ය අමාත්‍යවරයා ශ්‍රී ලංකාව සහ ජපානය අතර පවතින පුළුල් සබඳතාවය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා අදහස් හුවමාරු කර ගත් අතර ඒ සඳහා සමුද්‍රීය ආරක්ෂාව සහ සංවර්ධන සහයෝගීතාවය සහ නව G7 කාන්තාව, සාමය සහ ආරක්ෂාවේ සහකාරීත්වයට මුලපිරීම (WPS Partnership Initiative)යන ක්ෂේත්‍රයන් ඇතුලත් කර ගැනීමේ වැදගත්කම අවධාරණය කරන ලදී.

G7 WPS ප්‍රයත්නය හරහා තිරසාර සාමය සාක්ෂාත් කර ගැනීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම, ඔවුන්ගේ මානව අයිතිවාසිකම් වලට ගරු කිරීම ධනාත්මක ලෙස කඩිනම් කිරීම ඉලක්ක වූ අතර 2018 අප්‍රේල් මාසයේ පැවති G7 අමාත්‍යවරුන් ගේ සමුළුවේදී ඒ සඳහා එකඟතාවකට

පැමිණෙන ලදී (https://g7.gc.ca/en/g7-presidency/themes/building-peaceful-secure-world/g7-ministerial-meeting/g7-foreign-ministers-joint-communique/g7-women-peace-security-partnerships-initiative/). රාජ්‍ය අමාත්‍ය නකානෙ මහතා ශ්‍රී ලංකාව, ජපානය සමග එකතුවෙමින් මෙම WPS න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයාම සඳහා එකඟතාවය පළකිරීම පිළිබඳව ප්‍රශංසා කළ අතර අනෙකුත් G7 සාමාජිකයින් සමග සහයෝගීත්වයෙන් එම වැයමට රුකුලක් වීම ජපානයේ ඒකායන අභිප්‍රාය වන බව ප්‍රකාශ කරනු ලැබීය. (නිමි)

ෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆෆ

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.
දේශපාලන අංශය, ජපන් තානාපති කාර්යාලය
දුරකථනය 011-2693831-3 (ext.222)